SLGURU.LK

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education - Western Province**

**වර්ෂ අවසාන ඇගයීම - (2025)**
**ஆண்டிறுதி மதிப்பீடு - (2025)**
**Year End Evaluation - (2025)**

11639

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 9 | විෂයය / பாடம் / Subject: ගණිතය | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 02 |

නම / பெயர் / Name ........................................................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ....................................


- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.

01. 1, 5, 9 ............. යන රටාවේ ඊළඟ පද දෙක ලියා දක්වන්න.

02. 1.35 ආසන්න පළමු දශමස්ථානයට වටයා ලියන්න.


03. සුළු කරන්න. $3\frac{1}{3}$ න් $\frac{2}{5}$

04. ගණක රාමුවේ දක්වා ඇති ද්විමය සංඛ්‍යාව, දශමය සංඛ්‍යාවක් ලෙස ලියා දක්වන්න.




05. $-3(4-2x) + 7x$ ප්‍රකාශනය වරහන් ඉවත් කර සුළු කරන්න.

06. ධාරිතාව $6l$ වූ භාජනයෙන් තුනෙන් දෙකක් ජලයෙන් පිරවීමට $100ml$ භාජනයෙන් කොපමණ වාර ගණනක් ජලය වත් කළ යුතුද?







For Educational Purpose Only
SLGURU.LK


SLGURU.LK

07. $a$ හා $b$ හි අගය සොයන්න.




08. $xa - 5a + 3x - 15$ මෙම වීජීය ප්‍රකාශනයේ සාධක සොයන්න.


09. $A^{/}$ ප්‍රදේශය දී ඇති වෙන් රූප සටහනේ අඳුරු කර දක්වන්න.




10. වෙළෙන්දෙක් රුපියල් 40 බැගින් මිලදී ගත් අභ්‍යාස පොතක් රුපියල් 70ට විකුණයි නම්, ඔහු ලැබූ ලාභය සොයා ලාභ ප්‍රතිශතය ගණනය කරන්න.


11. $3x^{-4} \times 2x^{3}$ සුළු කර පිළිතුර ධන දර්ශක සහිතව ලියා දක්වන්න.

12. ABCD සමාන්තරාස්‍රයේ වර්ගඵලය $32cm^2$ ක් වේ. ලම්බ උස ($h$) සොයන්න.




13. $6.24 \times 10^4$ සාමාන්‍ය ආකාරයෙන් දක්වන්න.

14. $x$ හි අගය සොයන්න.






For Educational Purpose Only

SLGURU.LK

SLGURU.LK

15. පහත දැක්වෙන එක් එක් සම්බන්ධතා අනුලෝම සමානුපාත වේ නම් ( √ ) ලකුණ ද, නොවේ නම් ( × ) ලකුණ ද, යොදන්න.


(a) පැන් ගණන සහ ඒ සඳහා වැය වන මුදල

(b) වෘත්තයක අරය හා පරිධිය


(c) නියත දුරක් ගමන් කිරීමට ගතවන කාලය හා ගමන් කළ වේගය

16. අංක 1 සිට 6 දක්වා අංකනය කරන ලද දාදු කැටයක් පෙරළීමේ දී උඩු අතට හැරී වැටෙන පැත්තේ අගය වර්ග සංඛ්‍යාවක් ලැබීමේ සම්භාවිතාව සොයන්න.

17. රූප සටහන ඇසුරින් $x$ හා $y$ හි අගය සොයන්න.





18. $m$ හි අගය සොයන්න.




19. 8, 6, 12, 18, 11, 11, 16, 18, 5, 4, 13 මෙම සංඛ්‍යා ව්‍යාප්තියේ පරාසය සොයන්න.

20. AB හා BC මාර්ග දෙකකට සමදුරින් හා B සිට 5m දුරින්, P නම් පහන් කණුවක් සිටුවිය යුතුය. පථ පිළිබඳ දැනුම භාවිතයෙන් P හි පිහිටීම දළ රූපසටහනකින් දක්වන්න.






For Educational Purpose Only

SLGURU.LK

SLGURU.LK

## II පත්‍රය

- **ප්‍රශ්න හයකට පමණක් පිළිතුරු සපයන්න.**
- **එක් ප්‍රශ්නයකට ලකුණු 10ක් හිමි වේ.**

01. සුනීතා මිලට ගත් නවකතා පොතකින් පළමු දිනයේ $\frac{2}{5}$ ක් ද, දෙවන දිනයේ $\frac{1}{3}$ ක් ද, කියවා අවසන් කරන ලදී.

(i) මුල් දින දෙකේ දී කියවා අවසන් කරන ලද ප්‍රමාණය, මුළු පොතෙන් භාගයක් ලෙස ලියන්න.


(ii) තුන්වන දිනයේ දී ඉතිරියෙන් $\frac{1}{2}$ ක් කියවන ලද නම්, තුන්වන දිනයේ කියවන ලද ප්‍රමාණය මුළු පොතෙන් කොපමණ භාගයක් ද?

සුනීතා මෙම පොත පොත් සාප්පුවකින් මිලට ගැනීමේ දී 20%ක වට්ටමක් ලැබුණි. වට්ටම රුපියල් 480 ක් නම්,

(iii) පොතෙහි ලකුණු කර තිබූ මිල සොයන්න.

(iv) පොතෙහි මිල ලකුණු කර ඇත්තේ 60% ක ලාභයක් ලැබෙන සේ නම්, වෙළෙන්දා පොත ගත් මිල සොයන්න.

02. රූපයේ දැක්වෙන්නේ ඍජුකෝණාස්‍රාකාර හැඩයක් සහ කේන්ද්‍රික ඛණ්ඩ කොටස් දෙකක හැඩයන් භාවිතයෙන් සකස් කර ඇති කොට්ට උරයක මෝස්තරයකි. එහි පළල 28cm කි.




(i) ඍජුකෝණාස්‍ර හැඩයේ දිග ගණනය කරන්න.

(ii) ABCD කොටසේ වර්ගඵලය ගණනය කරන්න.

(iii) නිල් පාට ලෙස දක්වා ඇති රෙදි කැබැල්ලේ $100cm^2$ ක මිල රුපියල් 150 ක් නම්, නිල් පාට රෙදි කැබැල්ලේ මිල ගණනය කරන්න.

03. (a) (i) පැන්සලක මිල රු. $x$ වේ. පෑනක මිල, පැන්සලේ මිලට වඩා රුපියල් 5ක් වැඩිය. පෑනක් හා පැන්සලක් මිලදී ගැනීමට රුපියල් 25ක් වැයවේ නම්, පැන්සලක මිල සොයන්න.

(i) $5x - 2y = 0$

$3x - 2y = 2$ සමගාමී සමීකරණය විසඳන්න.

(b) $\frac{3x}{4} - 5 = 4$ සමීකරණය විසඳන්න.

04. (a) 9 ශ්‍රේණියේ ඉගෙනුම ලබන සිසුන් 40ක් සිටින පන්තියක, ඔවුන්ගේ උස මැනීමෙන් ලබාගත් තොරතුරු පහත වගුවේ දක්වා ඇත.

| උස (cm) | සිසුන් ගණන |
|---|---|
| 135 | 5 |
| 136 | 8 |
| 137 | 10 |
| 138 | 12 |
| 139 | 3 |
| 140 | 2 |

(i) ඉහත තොරතුරුවල,
a. පරාසය
b. මාතය සොයන්න

(ii) ඉහත වගුව ඇසුරෙන්, සිසුවෙකුගේ මධ්‍යන්‍ය උස සොයන්න.

(b) බෑගයක සර්වසම රතුපාට (R) බෝල 3 ක්ද නිල්පාට (B) බෝල 2ක් ද, කහපාට (Y) බෝල එකක් ද, ඇත. අහඹු ලෙස බෑගයෙන් බෝලයක් ඉවතට ගෙන එහි වර්ණය සටහන් කරගනු ලැබේ.

(i) ඉහත සසම්භාවී පරීක්ෂණයේ නියැදි අවකාශය ලියන්න.

(ii) කහපාට බෝලයක් ලැබීමේ සම්භාවිතාව සොයන්න.

(iii) නිල්පාට බෝලයක් නොලැබීමේ සම්භාවිතාව සොයන්න.

For Educational Purpose Only



SLGURU.LK